# ව්‍යවසායකයා සහ ක්ෂුද්‍ර ණය




ලෝකයේ බොහෝ දෙනා භාණ්ඩ නිපදවති. සේවා හදුන්වා දෙති. භාණ්ඩ හා සේවා අලෙවියෙන් ලොව ජය ගණිති. අලෙවිකරන්නට මිලදි ගන්නන් සිටිය යුතුය. මිලදී ගන්නා භාණ්ඩය හෝ සේවා මිලදී ගන්නේ තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමටය. නැතහොත් තමා මුණ දෙන ප්‍රශ්ණයකට උත්තර භාණ්ඩ හා සේවාවෙන් ලබා ගැනීමටය. කුඩා වෙළඳපොලක්, මහා වෙළඳපොලක් මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොලක් ද නිර්මාණය වන්නේ එලෙසය.

යම් කෙනෙකුගේ ප්‍රශ්ණයක් නිරාකරණය කර දීමට ව්‍යවසායකයා යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිර්මාණය කරයි. එම භාණ්ඩය හෝ සේවාව මිලකර, ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට උත්සහ දරණ මිලදීගන්නාට අලෙවි කරයි. මිලදී ගන්නා ප්‍රශ්නයෙන් නිදහස් වීම පිලිබඳව සතුටු සිත් පහල කරගනී.

ව්‍යවසායකයාට මුදල් ලැබේ. ලාභය ලැබේ. ඔහු භෞතික සතුටක් ලබයි.

ඒ සැමටම වඩා ව්‍යවසායකයා වෙනත් තැනැත්තෙකුගේ ප්‍රශ්ණයක් නිරාකරණය කර ගැනීමට තම දැනුම ශක්තිය සහ කැපවීම වැය කරමින් තෘප්තිමත් මානසික තත්වයක් ඇති කර ගනී. මෙම මුදල සහ මානසික තෘප්තිය ව්‍යවසායකයා සදා කාලීන තෘප්තිමත් මිනිසෙකු බිහි කරයි.

එය රටට ශකිතියකි. දායාදයකි.

ක්ෂුද්‍ර ණය තුලින් ව්‍යවසායකයන් දහස්ගනන් බිහිවන බව අපි සැවොම දනිමු.

භාණ්ඩය හෝ සේවාව තම ශක්තියෙන් නිපදවූ පසු අලෙවිකරණය තුල ඉදිරියට යෑමට මුදල් අවශ්‍යය. මුදල් බැංකුවක් මගින් ලබා ගත හැක. නැතිනම් ෆිනෑන්ස් සමාගමකින් ලබා ගත හැකිය.

ඒ දෙකටම ඇපකරුවන් අවශ්‍යය. ඇපයක් අවශ්‍යය. කුඩා ව්‍යවසායකයෙකුට මේ අවශ්‍යතා දෙකම ඉටුකර ගත නොහැක. එවිට රටපුරා අතෘප්තිමත් ජනතාවක් බිහිවනු ඇත.

එය රටටම මහ විපතකි.

ඉතා කුඩා හෝ මධ්‍යම ව්‍යවසායකයකුට ඉතිරිව ඇත්තේ මග දෙකකි. ගිනි පොලී කරුවන් හෝ ක්ෂුද්‍ර ණය තුලින් මුදල් ලබා ගැනීමටය. පොලීකරුවන්ගෙන් මුදල් ලබාගෙන භාණ්ඩය හෝ සේවාව හරි මුදලට අලෙවිකල නොහැක. ව්‍යසායෙකුට ඇපකරුවන් හෝ ද්‍රව්‍ය ඇප නොතබා ණය ලබා ගැනීමට හැකි විය යුතුය. එයට එකම මග ක්ෂුද්‍ර ණය ව්‍යාපෘතිය බව ඉතා පැහැදිලිය.

ඒ සඳහා ක්ෂුද්‍ර ණය ව්‍යාපෘති වලට රජය සහය අන්වාර්‍යයෙන් ලැබිය යුතුව තිබේ. ඒ අඩු පොලී අනුපාතයට ව්‍යවසායකයන්ට ණය ලබා දීමටය.

එය රජයට වැටහුනු දිනෙක, ශ්‍රී ලංකාවට සංවර්ධණය කරා කඩිනමින් පියනගනු ඇත.

අදහස
වික්ටර් රත්නායක

# මී වදය සහ මී පැණි

මී පැණි වලින් හොඳ ආදායමක් ලැබිය හැකිය. වද බඳින්නට බඳින්නට අතමිට සරුවන බව අපි සැවොම දනිමු. මී වද ප්‍රමාණය වැඩිකරන්නට, සැමදා පැණි ගන්නට මී මැස්සන් ඇති කිරීම ක්‍රමානුකූලව කළ යුතුය. වැඩි තණ්හාවට ගොස් මී වද මිරිකා එකවර පැණි ගන්නට ගියහොත් සිදුවන්නේ මී වදයද මී පැණි ද ඔබට අහිමිව යාමය. රජ මැස්සිය මියගියහොත් ඔබට සිදුවන්නේද ඒ අපරාධයමය. එලෙස මී වදයෙන් පැණි ගන්නාසේම තමන්ගේ ව්‍යාපාරයද සුරැකිව ක්‍රමානුකූලව ඉදිරියට ගෙන යා යුතුය. එසේ නැතිව මී වද මිරිකා එකවර පැණි ගන්නට උත්සාහ කරන්නාක් මෙන් ලාභය සඳහා භාණ්ඩ මිල අධික කළොත් ඔබේ ව්‍යාපාරයටද අත්වන්නේ කණගාටුදායක ඉරණමකි.

මී පැණි බෙහෙතක් ලෙසද යොදා ගැනේ. එය ක්‍රමානුකූලව ගත්විට ලෙඩ සුවවේ. එහෙත් අනවශ්‍ය ලෙස පාවිච්චි කළහොත් අත්වනුයේ අනර්ථකාරී විපාකය. ක්‍රමානුකූලව ඔබේ ව්‍යාපාරය දියුණුව කරා මෙහෙයවීමෙන් ඔබගේ දියුණුව සැලසෙනවා පමණක් නොව සිතගත සැනසී ලෙඩ සුවවන අතර සිතේ සතුට නිසා දිගුකල් ජීවත්වන්නට අවස්ථාවද ලැබේ.

ඔබ පමණක් නොව ඔබගේ සේවකයන්ද සතුටින් තැබිය යුතුය. මලින් මලට ගොස් මල නොතලා රොන් ගන්නේ පොඩි මී මැස්සන්ය. පැණි බිඳ බිඳ එකතු කොට මී වදය පුරවන පොඩි මී මැස්සන් මෙන් ඔබගේ ව්‍යාපාරයටද ශ්‍රමය හා සම්පත් එකතු කොට දී ව්‍යාපාරය දියුණු කරවන්නේ සේවකයන්ය. ස්වාමියා හා සේවකයන් එකාවන්ව සහයෝගයෙන් කටයුතු කළහොත් ව්‍යාපාරය දියුණු වේ. ශක්තිමත් වේ. එබැවින් බිඳෙන් බිඳ පැණි එකතුකොට මී මැස්සන් මී වදය බඳින්නාසේද සුරැකිව හා ක්‍රමානුකූලව එම වදයෙන් පැණි ගන්නා සේද ඔබද ඔබගේ ව්‍යාපාරය පියවරෙන් පියවර දියුණුව කරා ගෙන යාමෙන් අනාගතයේ ව්‍යාපාරය මෙන්ම ඔබද ඔබගේ සේවක මඩුල්ලද දිදුලනු ඇත. රටම දිලෙනු ඇත.